# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2004 අංක 9 දරන දුම්කොළ බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2004 ඔක්තෝබර් මස 08 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2004 ඔක්තෝබර් මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 6.75 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2004 අංක 9 දරන දුම්කොළ බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2004 ඔක්තෝබර් මස 08 වන දින]

එල්. ඩී.—ඕ. 18/2004.

### 1999 අංක 8 දරන දුම්කොල බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2004 අංක 9 දරන දුම්කොළ බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1999 අංක 8 දරන පනතට පොදු සංශෝධනය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1999 අංක 8 දරන දුම්කොළ බදු පනත —

(අ) ඒ ප්‍රඥප්තියේ "සිගරැට් ආදේශක" යන යෙදුම යෙදී ඇති සෑම තැනකින් ම ඒ යෙදුම ඉවත් කිරීමෙන් ; සහ

(ආ) ඒ ප්‍රඥප්තියේ දීර්ඝ නාමයේ සහ ලුහුඬු නාමයේ හැර, "දුම්කොළ" යන වචනය යෙදී ඇති සෑම තැනකට ම, "දුම්කොළ හෝ බීඩි දුම්කොළ" යන වචන ආදේශ කිරීමෙන්,

ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය 5අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

"බීඩි දුම්කොළ ආනයනය කිරීම.

5අ. (1) කිසිම තැනැත්තකු, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද තත් කාර්යය සඳහා සුරාබදු බලපත්‍රයක් දරන්නකු නම් මිස, බීඩි දුම්කොළ ආනයනය කිරීම නොකළ යුතු ය.

(2) බීඩි දුම්කොල ආනයනය කිරීම පිණිස, බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම, —

(අ) නියම කරනු ලැබිය හැකි ආකෘති පත්‍රයකට අනුව සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ;

(ආ) නියම කරනු ලැබිය හැකි මුදලක ඉල්ලුම්පත්‍ර ගාස්තුවක් ද සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

2-H 22758 - 4,700 (2004/08)

(3) බීඩි දුම්කොල ආනයනය කිරීම සඳහා බලපත්‍රයක් දරන සෑම තැනැත්තකු විසින් ම, සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබූ කවර හෝ අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි යම් විශේෂිත කාලසීමාවක් හෝ කාල සීමාවන්වලට අදාළව තමා විසින් ආනයනය කරන ලද බීඩි දුම්කොළ පිළිබඳ විස්තර ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.” .

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

“වරෙන්තුවක් ඇතිව හෝ නැතිව පරීක්ෂා කිරීමේ බලය.

7. (1) මේ පනත යටතේ යම් වරදක් සිදුකර ඇත්තේ ද නැතහොත් සිදු කරමින් පවතී ද යන්න නිශ්චය කර දැනගැනීම සඳහා හෝ යම් බෝට්ටුවක, යාත්‍රාවක, වාහනයක, කන්ටේනරයක, කර්මාන්ත ශාලාවක හෝ පරිශ්‍රයක, දුම්කොළ, සිගරට්, සුරුට්ටු, බීඩි, බීඩි දුම්කොළ හෝ පයිප්ප දුම්කොළ කොපමණ ප්‍රමාණයක් තිබේ ද යන්න නිශ්චය කර ගැනීම සඳහා හෝ ඒවා සම්බන්ධයෙන් දුම්කොළ බද්ද, 1994 අංක 8 දරන සුරාබදු (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව ගෙවිය යුතු යම් බද්දක්, තීරු බදු හෝ වෙනත් යම් බද්දක්, ගෙවා තිබේ ද හෝ ගෙවනු ලැබිය යුතු ද යන්න නිශ්චය කර දැනගැනීම සඳහා හෝ මේ පනත යටතේ සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත සපයා ඇති යම් වාර්තාවක හෝ ප්‍රකාශයක සත්‍යතාව සනාථකර ගැනීම සඳහා හෝ අවස්ථාවෝචිත පරිදි, දුම්කොළ, සිගරට්, සුරුට්ටු, බීඩි, බීඩි දුම්කොළ හෝ පයිප්ප දුම්කොළ යනාදියට අදාළ පොත් හෝ ලේඛන කිසිවක් පරීක්ෂා කිරීම සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ සුරාබදු දෙපාර්තමේන්තු පරීක්ෂකවරයකුගේ නිලයට වඩා පහළ නොවූ නිලයක් දරන නිලධරයකු විසින් හෝ රේගු දෙපාර්තමේන්තුවේ අධිකාරිවරයකුගේ නිලයට වඩා පහළ නොවූ නිලයක් දරන නිලධරයකු විසින් හෝ උප පොලිස් පරීක්ෂකවරයකුගේ නිලයට වඩා පහළ නොවූ නිලයක් දරන පොලිස් නිලධරයකු විසින්, —

(අ) ලබාගත් තොරතුරු මත සහ අවශ්‍ය යයි තමා විසින් සලකනු ලබන පරීක්ෂණයකින් පසුව මේ පනත යටතේ වරදක් සිදු කරනු ලැබ ඇති බවට හෝ සිදු කිරීමට ඉඩ ඇති බවට විශ්වාස කිරීමට හේතු සහිතව, මහෙස්ත්‍රාත්වරයකු විසින් නිකුත් කරනු ලබන වරෙන්තුවක් මගින් දී ඇති බලය මත ද ; හෝ

(ආ) මේ පනත යටතේ වරදක් සිදු වෙමින් පවතින හෝ සිදුවීමට ඉඩ ඇති කවර හෝ අවස්ථාවක දී, සහ බේරීයාමට අවස්ථාවක් වරදකරුට ලබා නොදී, නැතහොත් සිදු වෙමින් පවතින හෝ සිදුවීමට ඉඩ ඇති වරද පිළිබඳ සාක්ෂි සැඟවීමේ අවස්ථාවක් වරදකරුට ලබා නොදී, සෝදිසි වරෙන්තුවක් ලබාගත නොහැකි වන කවර හෝ අවස්ථාවක දී, ඔහු විසින් විශ්වාස කරනු ලබන හේතු වාර්තාගත කිරීමෙන් පසුව, වරෙන්තුවක් නොමැතිව ද —

(i) මේ පනත යටතේ වරද සිදු කරන බවට සැක කරනු ලබන යම් තැනැත්තකු නවතා පරීක්ෂා කරනු ලැබිය හැකි ය ;

(ii) දුම්කොළ, සිගරැට්, සුරුට්ටු, බීඩි, බීඩි දුම්කොළ, පයිප්ප දුම්කොළ හෝ මේ පනත යටතේ යම් තහනම් භාණ්ඩයක් රැගෙන යන හෝ ප්‍රවාහනය කරන නැතහොත් රැගෙන යන්නේ යයි හෝ ප්‍රවාහනය කරන්නේ යයි සැක කරනු ලබන යම් බෝට්ටුවක්, යාත්‍රාවක්, වාහනයක් හෝ යම් කන්ටේනරයක් නවතා පරීක්ෂා කළ හැකි ය ;

(iii) එම බෝට්ටුවේ, යාත්‍රාවේ, වාහනයේ හෝ කන්ටේනරයේ සිටින යම් තැනැත්තකු වෙත ඇති හෝ එහි රැගෙන යන යම් ඇසුරුමක්, පාර්සලයක් හෝ බඳුනක් විවෘත කොට පරීක්ෂා කරනු ලැබිය හැකි ය ; හෝ

(iv) දුම්කොළ, සිගරැට්, සුරුට්ටු, බීඩි, බීඩි දුම්කොළ හෝ පයිප්ප දුම්කොළ තබා ඇති හෝ ගබඩා කර ඇති හෝ තබා ඇති බවට නැතහොත් ගබඩාකර ඇති බවට සැක කරනු ලබන යම් කර්මාන්ත ශාලාවකට හෝ පරිශ්‍රයකට ඇතුලු වී පරීක්ෂා කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් නිලධරයකු විසින්, එකී උපවගන්තිය මගින් ඔහු වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී —

(අ) යම් තැනැත්තකුගේ සන්තකයේ ඇති හෝ යම් බෝට්ටුවක, යාත්‍රාවක, වාහනයක හෝ කන්ටේනරයක රැගෙන යනු ලබන හෝ ප්‍රවාහනය කරනු ලබන නැතහොත් යම් කර්මාන්ත ශාලාවක හෝ පරිශ්‍රයක තබා ඇති හෝ ගබඩාකර ඇති, යම් තහනම් භාණ්ඩයක්, තහනමට ගනු ලැබිය හැකි ය ;

(ආ) එවැනි යම් තැනැත්තකුගේ සන්තකයේ ඇත්තා වූ හෝ එවැනි යම් බෝට්ටුවක, යාත්‍රාවක, වාහනයක හෝ කන්ටේනරයක රැගෙන යනු ලබන්නා වූ නැතහොත් යම් කර්මාන්ත ශාලාවක හෝ පරිශ්‍රයක තබා ඇත්තා වූ හෝ ගබඩා කර ඇත්තා වූ ද, එම වරද සඳහා සාක්ෂියක් වශයෙන් ඉදිරිපත් කරනු ලැබිය හැකි වූ ද, යම් ලේඛනයක් තහනමට ගනු ලැබිය හැකි ය ;

(ඇ) යම් තැනැත්තකුගේ සන්තකයේ තහනම් භාණ්ඩ ඇත්නම් හෝ මේ පනත යටතේ වරදක් සිදු කිරීමෙහි ලා භාවිත කරන ලද යම් බෝට්ටුවක්, යාත්‍රාවක්, වාහනයක් හෝ කන්ටේනරයක් ඒ තැනැත්තා විසින් පාලනය කරනු ලබන්නේ නම් හෝ, මේ පනත යටතේ වරදක් සිදු කිරීම හේතුවෙන් ඔහු අත්අඩංගුවට ගෙන රඳවා තබා ගනු ලැබිය හැකි ය ;

(ඈ) වරද සිදු කිරීමෙහි ලා භාවිත කරනු ලැබ ඇති බවට හෝ භාවිත කරනු ලබන බවට එම නිලධරයාට පෙනීයන්නා වූ ද එම වරද පිළිබඳ සාක්ෂියක් ලෙස ඉදිරිපත් කරනු ලැබිය හැකි වූ ද, යම් බෝට්ටුවක්, යාත්‍රාවක්, වාහනයක්, කන්ටේනරයක් හෝ වෙනත් යම් භාණ්ඩයක් හෝ උපකරණයක් තහනමට ගනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් සෑම නිලධරයකු ම, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ ඒ පනතේ කාර්ය සඳහා සාම නිලධරයකු වශයෙන් සැලකිය යුතු ය.

(4) (1) වන සහ (2) වන උපවගන්ති මගින් ඔහු වෙත පැවරී ඇති බලතල, යම් නිලධරයකු විසින් ක්‍රියාත්මක කිරීමේ දී, එම නිලධරයාට විරෝධය පාන හෝ අවහිර කරන සෑම තැනැත්තකුම මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

මේ වගන්තියේ කාර්ය සඳහා " තහනම් භාණ්ඩ " යන්නෙන්, දුම්කොළ බද්ද හෝ වෙනත් යම් බද්දක් අයකරනු ලැබ නොමැති යම් දුම්කොළ, සිගරැට්, සුරුට්ටු, බීඩි, බීඩි දුම්කොළ හෝ පයිප්ප දුම්කොළ අදහස් වේ. ".

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ " බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ" යන වචන වෙනුවට, " බීඩි, බීඩි දුම්කොළ හෝ පයිප්ප දුම්කොළ" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ, " බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ" යන වචන වෙනුවට, " බීඩි, බීඩි දුම්කොළ හෝ පයිප්ප දුම්කොළ" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ " බීඩි, සිගරැට්, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ" යන වචන වෙනුවට, " බීඩි, බීඩි දුම්කොළ හෝ පයිප්ප දුම්කොළ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ " පනවනු ලැබිය හැකි උපරිම දඩයෙන් පහෙන් පංගුවකට සමාන මුදලක් " යන වචන වෙනුවට, " රුපියල් ලක්ෂ පහකට නොවැඩි මුදලක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(iii) එම වගන්තියේ (7) වන උපවගන්තියේ ,—

(අ) " බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ" යන වචන වෙනුවට, " බීඩි, බීඩි දුම්කොළ හෝ පයිප්ප දුම්කොළ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) "ඒවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ඉන් උපලබ්ධ වන මුදල 17 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට බැහැර කරනු ලැබිය යුතු ය" යන වචන වෙනුවට, "ඒවා විනාශ කිරීමට කටයුතු සැලැස්විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8**. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ආ) දුම්කොළ, සිගරට්, සුරුට්ටු, බීඩි, බීඩි දුම්කොළ හෝ පයිප්ප දුම්කොළ විකිණීමෙන් හැර 15 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ රාජසන්තක කරන ලද භාණ්ඩ සහ වාහන විකිණීමෙන් උපලබ්ධ වන මුදල්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ "බීඩි" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" "බීඩි දුම්කොළ" යන්නෙන් බීඩි නිෂ්පාදනය කිරීම සඳහා භාවිත කරනු ලබන දුම්කොළ අදහස් වේ ;".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**10**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.